

# ගම්දොර මතකය



## සුනිල් සරත් පෙරේරා

මිහිලිය උකුල මිණි මෙව්ලෙව් කඳුකරය
හිමිදිරි උදය මිහිඳුම් බර මනහරය
දෙණිපෙත නැගුණි විහඟුන් දුන් ගීසරය
මට මා සොඳුර හමුවූයේ ගම්දොරය

හිරුටද පළමු අවදිව ලිඳ වෙත ඇඳුණෝ
දියපිරි කලය ගමනට උතුරා හැලුණෝ
මදහස බැල්ම අරුනළු පොකුරේ පිපුණෝ
ගැමි ගති සිරිත මියැදෙන තුරු නොම බිඳුණෝ

අගස්තියේ මාලය ගෙල වට බැන්ද
වෙසඟ දාක ඔසරිය පළමුව ඇන්ද
දළුග්ගලේ පන්සල වෙහෙරට වැන්ද
කල එලි ගමන සිහිවෙයි අප අත්වින්ද

චිමිනිය ලාම්පුව දැල්වුනි එලිපත්තේ
රටා වියපු පැදුරක වට හිඳගත්තේ
පංච පෙතට කෙලිනා තරඟය මත්තේ
යම් තම් සිනා ඇගෙ වත සඳ දැකගත්තේ

නොඇසෙන සරින් කඳුලේ පිනි කැට රඳවා
සුළඟ ඇවිත් සුසුමට සුසුමක් හෙලුවා
ගලන දොලේ පාමුල පාමුදු සොලවා
ඇය ලඟ එතැයි අවදිව ඇස ඇර බැලුවා

උපත ජරාවට පත්වී මිය යාම
නියතය අනියතය එය අටලෝදහම
ඉරනම අනුව එක්වී වෙන්වී යාම
නවතන කෙනෙක් නැත බිහිවී ලොවතාම



# මට ගම කී දේ

මා ඉපදුණු ගම්මානය ගැන හරි තුටුයි
ඒ සිහිකළුවිට එන්නේ අමිල හැඟීමයි
මීමහ කන්දයි නිල් දිය පිරි වෙලේ ළිඳයි
ඈත වෙලේ පිපි කෙකටිය මල් තව සුවඳයි

දෙවටදිගේ ඇති ඇල්බීසියබති මැද්දේ
හිරුට සිනාසෙන මල්වල රොන් බිඟු ඇද්දේ
රැලි රැලි සුදු ගවුම ඇඳන් සිහිනිඟ මැද්දේ
පොත් රඳවා අතුරට යන කුමරිය සිත්දේ

ළමා විය වටේ එදා අප එක් වූයේ
කතා කදිම අසා කියා දස්කම් පෑයේ
එදා කියූ ඇසූ දෙයෙහි හිති ගැබ් වූයේ
සදා හදෙන් නොමැකී යන දහමක් වූයේ

ගමේ අරමෙ හා සමිඳුගෙ වට රැස්වන්නේ
ඒ සනිදා ඒ ඉරිදා නැවත නො එන්නේ
පේළියෙ පිටුපස හිටියත් සවන යොමන්නේ
වාදයකින් ජයපිට ජය හැම විට ගන්නේ

යොවුන් සිතේ පොපියන දෑ ගීතයක් වෙලා
ටිකිරි කොමලියන් මැද්දෙ රස ගඟක් ගලා
දෙපසට වී කළ වාදය නැත නිමක් වෙලා
එන සතියෙත් එක්වෙනු ඇත විසඳුමක් බලා

හර බර ලෙස බස මෙහෙයන කවි ගී සින්දූ
නිසි තැන නිසි මග පෙන්වන යහ ගුණ කැන්දූ
රට දැයවෙත හා දහමට බැති හද රැන්දූ
එදා ළමා විය අපට සුර සැප කැන්දූ

කී රහසක් ඈත හද පතුලේ සටහන් වී
ඒ පළ කැරුමට දහස් දේ ඇත ලියැවී
ආලයටත් වැඩි මානව ගුණ එහි ගැබ්වී
පෑ සෙනෙහසකින් ඔබ්බෙහි නැත කිසිවක් වී

පතුලේ සිට හිමිදි විත් හද මතු මත්තේ
මිමිනු ඒ නැවුම් හැඟුම් සිත බැඳ ගත්තේ
ගමේ කුමර ළතාවියන් හැම එක පැත්තේ
මැවූ පැතුම් තුළිනි දිවිය රස ලැබ ගත්තේ

පෝදා සිල් ගැනුමට සමිඳුන් වට සැදුනා
හැඩ තර දෙසු බුදු සිරිතෙන් දිවි මග පෙනුනා
මවු පිය වැඩිහිටි ගුරුවර බස හද රැඳුනා
දෙස බස රැස හැදියාවට හිති මහ බැඳුනා

උදෑසනින් පාසැල වෙත පිවර නැගුවා
සිදාදියෙන් සරසවියගෙ විදු සත පිරුවා
නිමා සැණින් රට දැය වෙත නිසි මෙහෙ කෙරුවා
සදා සතුටෙ මුල් පාඩම මගෙ ගම දැරුවා

සංකල්පණා හා පබැඳුම්
හෙන්රි කුමාරප්පෙරුම

# අසරණ යානය තණ්හා මානය

## ප්‍රේමවංශ දසනායක
ඇල්ටෝනා

පුපුරා ගිය වෙඩිල්ල හඬ ගුවනේ දෙදරුම් කෑවා
බුරා නැඟුන ගිනි ජාලය ඇස් දල්වා බිම බැලුවා
සූරිය මල් යාය පිටින් උඩ අහසට අත පෑවා
මිනිසත් බව නොදුටු ලොවේ දෙවි බඹු අසරණ වූවා

'තණ්හාව අරටු කොට
සත්වයා ඉපිද ඇත
ජීවිතය පැවතුමට
තණ්හාව අවශ්‍යය'

කුස අහර ලබන්නට
හිස වහල සදන්නට
ගත විලිය වසන්නට
ඇවැසි දේ සොයන්නට

උපත සිට මියෙන තුරු
නිරතුරුව පොරබදන
ජීවිතය බැඳ තබන
රන් හුයයි තණ්හාව

ඈත සිතිජය ඉමේ
සයුරු කෙළවර බිමේ
රන් රුවන් රැගෙන එන
දේදුන්න තණ්හාව

එක සිතින් එක නෙතින්
ආවේශ වූ ලෙසින්
ආශාව හඹා යන
දෙපා යුග තණ්හාව

තරඟ කාරී ලොවේ
එකිනෙකා පරදවා
දිව යන්න ජවය දෙන
දිව ඔසුව තණ්හාව

දයා කරුණා සිසිළ
නොම දකින දිවි කතර
සදා හරිතව පෙනෙන
මිරිඟුවයි තණ්හාව

මහපොළොව අහස් කුස
සයුර ජල කඳ බෙදා
පෘථග්ජන දනන් තුළ
වෛර ගිනි අවුලුවා

එකිනෙකා ඇනකොටා
ගැනෙන යුද බිම් තනා
රජ කමට මඟ සොයන
බල අවිය තණ්හාව

එවන් වූ තණ්හාව
හදවතින් තුරන් කොට
මිනිස් කම ඒ තුලට
කෙසේ නම් පිවිසේද

තණ්හා පවුරු බැඳ මිහිකත දස දෙසින
ලෝකය බෙදා වෙන් කරගත් බලවතුන
ඇති නැති වෙනස ගිනිසිලු දල්වා නිතින
කෙළෙසනු කිමද මිනිසත් බව මේ ලෙසින

# විභාග ප්‍රතිඵල

## අතුල විජේවික්‍රම

*(උසස් පෙළ ව්‍යාපාර අධ්‍යයන සිසුවියක් කොට්ටාවේදී සුඛෝපභෝගී රියකට බිලි - වුවනක්)*

අම්ම රෑ කෝපි දී
මා ලඟින් ඉන්නවා
විභාගය කියා නිදිකිරනවා

අප්පච්චි සේසතම
ශිල්ප සැල් වලට දී
සිනාසීලා ඉන්න බලනවා

නෑ*යහළුවන් මා
වටේ බලා ඉන්නවා
බලිරූප අවතාර පෙනෙනවා

ඉල්ලූමයි - සැපයුමයි
යුද්ධයක් කරනවා
සමතුලිත කරන්නට නහිනවා

මේ විසල් යානයෙන්
වත් ඉගිලිලා යන්න
වළාවක් සේ
පාවෙලා නිදහසේ ඉන්න
ඔන්න මම දැන් මැදට පනිනවා
...(



වැදුණු
ගල් ගී පහරින්
ලේ ගලපු සිහින යායම;
නැවතත්,
දළු රිකිලි කැකුළු මල්
පුදමින් ඉපිද.

ඇවිද යම් එහි
හිමින් සීරුවට, ආදරෙන්-
සිහින රසවිඳ විඳ.

විත්,
නොපෑරෙනවාම නම් නොවේ
දෙපතුල;
තවමත් නොවැලුණු
ගල් ගී වලට.

එරංගා පෙරේරා





හදවතින් ඉකිබිඳින
හිත් කඳුළු පුරෝගෙන
දෙඇසින් සිනාවෙන
විය පෙම්වතෙකි සොඳ

ආදරය කැටුව ගිය
ජීවිතය වෙහෙසවී
නැවුම් දිය බිඳක් වී
සැතපුමක මුණගැසුන

කරදරවූ මාවතෙහි
අරුත් සුන් අතීතය
යව්වනයෙ මිළිනවී
සමුගන්නා කාලයයි
දැන්.........

බණ්ඩාර



# දුරු කතරෙ නුඹ දුරයි

වෙළ ලන්ද වන පෙතේ - එදා සුවඳම දැනේ
ඇල දොලේ වැව් දියේ - සිනා මැව් මැව් පෙනේ
නිදි නැතිව තුන් යමේ - හිත අවදිවන සෙනේ
දුරු කතරෙ නුඹ දුරයි... තනිවුනිද නුඹ ඔහේ

සුවඳ දුන් මල් පැලේ - පහන නෑ දැල්විලා
රටා දැමු ගෙම්දුලේ - වල් බිහිව ඉරිතලා
නැන්දම්ම ඉකිබිඳී - පිළ කොනේ වැතිරීලා
වළා පීරා යනෙන - වැහි ලිහිණි බල බලා

ලියුම් කරදහියකින් - වත් කියාපන් නගේ
නුඹෙ කඳුලකට ඇතිද - මිළ කරන්නට අගේ
දුක සැපම දෙපැත්තත් - වැටෙන කාසිය වගේ
පිපෙන්නයි රන් පියුම් - වාසනාවට නුඹේ

කල්දෙමුල්ල